සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය ( සැකසුම - ඩබ්. චන්ද්‍රිකා සමරසිංහ )

නොවැම්බර් මාසය- 5 සතිය 20 පාඩම - මහාසාර පළඳනාව

1)පිළිතුරු සපයන්න

1. එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය කීපයක නම් ලියන්න

2.සරච්චන්ද්‍රයන්ගේ බොහෝ නාට්‍යවල ප්‍රධාන ලක්ෂණය කුමක් ද?

3.මහාසාර නාටකය සඳහා පදනම් වූ ජාතක කතාව කුමක් ද?

4.නාට්‍යයේ පළමුවෙනි අංකයේ දී වැදිරිය හැඩ වී සිටින ආකාරය කෙබඳු ද?

5.වැදිරියගේ කරේ පැළඳි රන් මාලය නිසා ඇය සුරඟනක බඳු ය. මේ නිසා ඇයට ලැබෙන ප්‍රතිලාබ මොනවාද?

2) (අණ බෙරකරුගේ ප්‍රකාශය ඇසුරෙන්) යා කරන්න

| | |
|---|---|
| 1.නිර්ලජ්ජ | සොරෙකු |
| 2.දැහැමෙන් | අග බිසව |
| 3.අග්‍ර මහේසිකාව | මී හරක් |
| 4.ප්‍රාණය | ධාර්මික ව |
| 5.චෞරයෙකු | ලැජ්ජා නැති |
| 6.මහීෂ | පණ |

3)මහාසාර පළඳනාව සොරකම් කළ කෙනාට රජතුමා පමුණුවන මරණ දඬුවමෙහි ආකාර කීපයක් ලියා දක්වන්න."

4)මහාසාර පළඳනාව නැවතත් නොලැබේ යයි බිසව සිතන්නේ ඇයි?

5)මෙම නාට්‍ය කොටසෙහි හාස්‍ය මතු වන තැන් උපුටා දක්වන්න.

6) එදිරිවීර සරච්චන්ද්‍රයන් නාට්‍යමය අවස්ථා විස්තර කරන්නේ කෙසේ ද?

7)නාට්‍යයක් රචනා කළ හැකි ආකාර දෙක හඳුන්වන්න.

8)වර්තමානයේ භාවිත කරන වෙනත් නාට්‍ය ශෛලීන් හඳුන්වන්න.

9)අන්තර් ජාලයට පිවිස සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නරඹන්න.

10) "උඩඟුබව විනාශයට මුලයි" මැයෙන් රචනයක් ලියන්න.